// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2396/20 - 2024 අගෝස්තු මස 06 වැනි අඟහරුවාදා - 2024.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2021 (III)

### 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 54 වන වගන්තිය සමග කියවිය යුතු, ඒ පනතේ 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ට) ඡේදය යටතේ, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රනිල් වික්‍රමසිංහ,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 අගෝස්තු මස 05 වන දින,
කොළඹ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නියෝග

**1.** මේ නියෝග 2024 අංක 06 දරන කොළඹ වරාය නගරය (බද්ධ නිවාස අයිතිකම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** අවස්ථාවෝචිත පරිදි, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීමෙන් පසුව, තාවකාලික සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දෙපළේ අයිතිකරු හෝ අයිතිකරු සහ සංවර්ධකයා විසින්, පූර්ව විකුණුම්වලින් උපයාපගත් සියලු මුදල් අදාළ විලම්බලේඛ ගිණුමේ තැන්පත් කරනු ලබන බව සහතික කර ගැනීම පිණිස අදාළ ව්‍යාපෘතිය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවක විලම්බලේඛ ගිණුමක් විවෘත කරනු ලැබිය යුතු අතර, එම මුදල් සහාධිපත්‍ය ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා පමණක් භාවිත කරනු ලැබිය යුතු ය.

**3.** සහාධිපත්‍ය දේපළක, තාවකාලික සහාධිපත්‍ය දේපළක හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක ඇති පොදු අංගෝපාංග නිශ්චිත කොටසක හෝ සීමිත කොටස් සංඛ්‍යාවක ප්‍රවේශය සහ භුක්ති විඳීම සඳහා පමණක් ම විය හැකි අතර, ඒ අනුව අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය පිඹුරේ, තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ අවශ්‍ය සීමා නිර්ණය කිරීම් කරනු ලැබිය යුතු ය.

**4.** කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇති යම් සහාධිපත්‍ය දේපළක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වන සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමෙන් පසුව, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් වන්නා වූ කළමනාකරණ සංස්ථාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

**5.** (1) 4 වන නියෝගයේ සඳහන් පරිදි කළමනාකරණ සංස්ථාවක් පිහිටුවීමෙන් පසුව, සෑම කළමනාකරණ සංස්ථාවකට ම සභාවක් තිබිය යුතු අතර, එම සභාව, කළමනාකරණ සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමක දී තෝරා පත් කර ගනු ලැබිය යුතු ලේකම්වරයකුගෙන් සහ භාණ්ඩාගාරිකවරයකුගෙන් සමන්විත විය යුතු ය.

(2) සභාවේ රැස්වීමක මුලසුන, ඒ රැස්වීමට පැමිණ සිටින සභාවේ සාමාජිකයන් අතරින් ඒ රැස්වීම සඳහා තෝරාපත් කර ගනු ලබන සභාපතිවරයකු විසින් දරනු ලැබිය යුතු ය.

(3) සභාවේ ලේකම් හෝ භාණ්ඩාගාරික යන ධුරයක යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සභාවේ ඉතිරි සාමාජිකයන් විසින් ඉක්බිතිව ම එළඹෙන සභාවේ රැස්වීමේදී සභාවේ වෙනත් සාමාජිකයකු තෝරාපත් කරගනු ලැබිය යුතු ය.

**6.** කළමනාකරණ සංස්ථාවේ ලේකම්වරයාගේ කර්තව්‍යවලට පහත දේ ඇතුළත් විය යුතු ය:-

(අ) කළමනාකරණ සංස්ථාවේ රැස්වීම් වාර්තා සකස් කර බෙදා හැරීම;

(ආ) සභාවේ රැස්වීම් වාර්තා සකස් කර බෙදා හැරීම;

(ඇ) කළමනාකරණ සංස්ථාවේ හෝ සභාවේ සාමාජිකයන් සඳහා වන යම් දැන්වීම් ඇතුළුව, කළමනාකරණ සංස්ථාවේ හෝ සභාවේ යම් රැස්වීමක වාර්තා ස්ථිර කිරීම සඳහා වන යෝජනාවක්, අවස්ථාවෝචිත පරිදි, කළමනාකරණ සංස්ථාවේ හෝ සභාවේ ඊළග රැස්වීමේ දී ඉදිරිපත් කිරීම;

(ඈ) කළමනාකරණ සංස්ථාව අමතා කරනු ලබන සන්නිවේදනවලට පිළිතුරු සැපයීම;

(ඉ) කළමනාකරණ සංස්ථාවේ සහ සභාවේ රැස්වීම් කැඳවීම; සහ

(ඊ) කළමනාකරණ සංස්ථාවේ සහ සභාවේ සියලු පරිපාලන සහ ලේඛන කටයුතු පිළිබඳ අධීක්ෂණය කිරීම.

**7.** කළමනාකරණ සංස්ථාවේ භාණ්ඩාගාරිකවරයාගේ කර්තව්‍යවලට පහත දේ ඇතුළත් විය යුතු ය:-

(අ) කළමනාකරණ සංස්ථාවේ සහ සභාවේ රැස්වීම්වල දී ගන්නා ලද තීරණ ප්‍රකාරව සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගෙන් අයකරගනු ලැබිය යුතු යම් දායක මුදල් පිළිබඳව ඔවුන් වෙත දැනුම් දීම; සහ

(ආ) කළමනාකරණ සංස්ථාව වෙත ගෙවන ලද යම් මුදලක් ලබා ගැනීම, ලද බව දැන්වීම, ගණන් තැබීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවක ගිණුමක තැන්පත් කිරීම සහ නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වාගෙන යාම සහ අවශ්‍ය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.

8. කළමනාකරණ සංස්ථාව පහත දැක්වෙන වාර්තා නිසි පරිදි පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය:-

(අ) සහාධිපත්‍ය කොටස්වල වර්තමාන අයිතිකරුවන්ගේ නම් සමග ඔවුන්ගේ අදාළ ලිපිනයන් සහ සම්බන්ධ කර ගැනීමේ විස්තර ඇතුළත් වන රෙජිස්ටරයක්;

(ආ) කළමනාකරණ සංස්ථාව සහ සභාව යන දෙකෙහිම රැස්වීම් පිළිබඳ වාර්තා;

(ඇ) කළමනාකරණ සංස්ථාව සහ සභාව යන දෙකෙහිම ලැබීම්වලට සහ වියදම්වලට අදාළ ගිණුම් වාර්තා;

(ඈ) කළමනාකරණ සංස්ථාව වෙත භාර දෙන ලද දැන්වීම්;

(ඉ) අවම වශයෙන් අවුරුදු දහයක කාලසීමාවක් සඳහා, කළමනාකරණ සංස්ථාව වෙත ලැබී ඇති සහ කළමනාකරණ සංස්ථාව විසින් යවා ඇති ලිපි ගොනුවල පිටපත්; සහ

(ඊ) අවම වශයෙන් අවුරුදු දහයක කාලසීමාවක් සඳහා, කළමනාකරණ සංස්ථාවේ සහ සභාවේ රැස්වීම් පිළිබඳ දැන්වීම්.

9. (1) අයිතිකරු හෝ අයිතිකරු සහ සංවර්ධකයා ඇතුළුව යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාවේ අනුමතය සහිතව, පාර්ශ්වකරුවන් අතර එකඟ වන යම් නියමයන් සහ කොන්දේසි මත සහාධිපත්‍ය කොටස්වල තනි අයිතිකරුවන්ට අයත් වූ ද, නේවාසික කාර්යයන් සඳහා වූ ද, සේවාර්පිත බද්ධ නිවාස ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) එකී සේවාර්පිත බද්ධ නිවාස ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි ය.

10. කළමනාකරණ සංස්ථාව විසින්, බද්ධ නිවාස අයිතිකම් පනතේ 20ළ෴ වන වගන්තියේ (3අ) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි නිදන් අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

11. මේ නියෝගවල -

"බද්ධ නිවාස අයිතිකම් පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව අදහස් වේ;

"සංවර්ධකයා" යන්නෙන්, අදාළ ඉඩම් කැබැල්ලේ අයිතිකරු හෝ එම ඉඩම් කැබැල්ල තුළ සංවර්ධන කටයුත්ත කරගෙන යාම සඳහා බලය පවරනු ලැබ ඇති තැනැත්තා අදහස් වේ; සහ

"සේවාර්පිත බද්ධ නිවාස" යන්නෙන්, කෙටි කාලීනව සහ දිගු කාලීනව පදිංචිව සිටීම සඳහා පහසුකම් සහිත සම්පූර්ණයෙන් ම නිවසකට අවශ්‍ය බඩු මුට්ටු සහිත වූ සහාධිපත්‍ය කොටසක් අදහස් වේ.

EOG 08 - 0087

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.